පල්ලේපොල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරි ආයෝජන ගිණුමේ පැවැති රු.48,975 ක ශේෂය සඳහා වර්ෂයට අදාළ පොළී ගිණුම්ගතකර නොතිබුණි. | පොළී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සංවර්ධන ව්‍යාපෘති දෙකකට ගෙවියයුතු රු.1,142,635 ක මුදලක් ගිණුම්ගතකර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | නල ළිඳක් ඉදිකිරීමට සභා අරමුදලින් වැයකළ රු.625,048 ක මුදල ණය හිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදී අදාළ වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.**115,540,507** ක් වටිනා ගොඩනැඟිලි, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ලබාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.**56,059,395** ක් වූ විෂයයන් **2** කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර රු.**1,868,441** ක අසමානතාවයක් පැවැතුණි. | අසමානතාවයන් හඳුනාගෙන නිවැරදි කළ යුතු වේ. | උප ලේඛනවලින් මඟහැරී තිබීම හා ජ'නල් සටහන් මඟින් කළ ගැළපීම් ඇතුළත් නොවීම හේතුවෙන් මෙම වෙනස්කම් සිදුව ඇත. |

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ **5** ට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව රු.**19,051** ක් විය. | හිඟ ආදායම් හා ලැබිය යුතු මුදල් අයකරගත යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. අදාළ හිඟ ශේෂයන් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

#### (ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ **1**ත් **5**ත් අතර කාලයක් පැවැති ගෙවිය යුතු ශේෂයන්ගේ එකතුව රු.**724,119** ක් විය. | නිශ්චිතව හඳුනාගත් තොරතුරු මත ගිණුම්ගත කිරීමත් ගෙවිය යුතු මුදල් ගෙවීමටත් කටයුතු කළ යුතු වේ. | අවිච්ඡේද කර ණයහිමි කළ වැඩ කොටස් ඉටු නොකළ බැවින් සභා තීරණයක් ගෙන ඉදිරියේදී එම මුදල් කපා හැරීමට කටයුතු කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---

| ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.21,163,390 ක් වූ ගිණුම් විෂයන් 03ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂයන්ට අදාළ උපලේඛන පිළියෙල කළ යුතු වේ. | ඉන්වෙන්ට්‍රි ලේඛන, සවිකිරීම් ලේඛන හා වත්කම් ලේඛන |

1.4 අනුකූල නොවීම්

---

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 78(1) වගන්තිය | බල ප්‍රදේශයේ වෙළඳසැල්වල ආහාර සාම්පල් පරීක්ෂා කිරීම් හා ඊට අදාළ වැරදිකරුවන්ට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාර්තා කඩිනමින් ලබාගෙන පනතේ විධිවිධානයන් අනුගමනය කළ යුතු වේ. | ආහාර සාම්පල් අනුරාධපුර තත්ත්ව පාලන ඒකකය වෙත යොමුකරන අතර, එම වාර්තාවල ප්‍රමාදයන් හේතුවෙන් නඩු පැවරීමට නොහැකිවී ඇත. |
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත 21 වගන්තිය | ඉකුත් වර්ෂ 4 ක කාලයක් තුළ ඉදිරිපත් වූ ගොඩනැඟිලි අයදුම්පත්‍ර 369 කින් 202 ක් අනුමත කර තිබුණු අතර, ඉන් අනුකූලතා සහතික 27 ක් පමණක් නිකුත් කර තිබුණි. | අනුකූලතා සහතික නිකුත් කර අනුමත නොකළ අයදුම්පත්‍ර සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ. | අදාළ අයදුම්කරුවන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 571(3) | නිරවුල් කිරීමකින් තොරව අවස්ථා 4කට අදාල රු.281,103ක මුදලක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | නිරවුල් කළ හැකි තැන්පත් කඩිනමින් නිරවුල් කළ යුතු වේ. | ආදායමට බැර කිරීම සඳහා මුදල් කමිටුව තීරණය කර ඇති බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය 3.1 වගන්තිය** | වාහන 4 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කරමි. |

2 මූල්‍ය සමාලෝචනය
------------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**1,782,172** ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**22,422,916** ක් විය.

**2.2** ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2019** | | | | **2018** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | **2019** රැස්කළ ආදායම | දෙසැම්බර් **31** දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | **2018** රැස්කළ ආදායම | දෙසැම්බර් **31** දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **(i)** | වරිපනම් හා බදු | **850,000** | **1,119,404** | **830,011** | **289,393** | **882,000** | **1,113,177** | **896,750** | **216,427** |
| **(ii)** | කුලී | **9,648,000** | **1,584,004** | **1,596,929** | **124,937** | **4,336,000** | **235,400** | **138,100** | **137,862** |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | **510,000** | **683,885** | **675,885** | **8,000** | **800,000** | **670,870** | **671,870** | **-** |
| **(iv)** | වෙනත් ආදායම් | **45,833,544** | **40,085,952** | **35,745,916** | **4,340,016** | **43,318,1101** | **51,519,394** | **31,839,269** | **19,680125** |
| | එකතුව | 56,841,544 | 43,473,245 | 38,848,741 | 4,762,346 | 439,199,101 | 53,538,841 | 33,545,989 | 20,034,414 |

### 2.2.2 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙළඳ සංකීර්ණයේ කඩ කාමර **04**ක් අවිධිමත් ලෙස ටෙන්ඩර් කිරීම හේතුවෙන් **2019** වර්ෂය තුළ වසා දමා තිබුණු අතර, ඉන් සභා අරමුදලට සිදුව තිබූ පාඩුව රු.**108,500** ක් විය. | කඩිනමින් ටෙන්ඩර් කර කඩ කාමර පැවරිය යුතු වේ. | විධිමත් පරිදි ටෙන්ඩර්කර කඩ කාමර බදු දීමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.**679,062** ක් හා මුද්දර ගාස්තු රු.**7,175,103** ක් විය. | ලැබිය යුතු ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | **2020** ජනවාරි **09** දින උසාවි දඩ රු.**211,247** ක්ද මුද්දර ගාස්තු රු.**276,500**ක් ද ලැබී ඇති බව දන්වමි. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ **3** වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පූර්ව වර්ෂයේදී සැළසුම් කිරීමකින් තොරව ව්‍යාපෘති 49 ක් සඳහා රු.12,500,000 ක උපකල්පිත මුදලක් අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබූ අතර, ඉන් ව්‍යාපෘති 24 ක් සඳහා ඇස්තමේන්තු ද පිළියෙලකර නොතිබුණි. | අවශ්‍යතා හඳුනාගෙන අවධානයෙන් හා නිසි සැලකිල්ලෙන් යුතුව අයවැය සැකසිය යුතු අතර, වර්ෂය ආරම්භයේ සිට සැලසුම් සහගතව කටයුතු කළ යුතු වේ. | 2019 ජූනි 14 දින තෙක් සභා අනුමැතිය ලැබී නොතිබූ අතර පිටතින් ලැබූ ප්‍රතිපාදන සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට සිදු විය. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමක්ද සිදුකර නොතිබූ අතර, සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව මඟින් පාලනය වන ජල ව්‍යාපෘතිවල ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව එහි කෝලිපෝම් බැක්ටීරියා හා ඊ කෝලි සාන්ද්‍රණ ඉහල අගයක් ගෙන තිබුණි. | නිසි ගුණත්වයෙන් යුතු පිරිසිදු පානීය ජලය බෙදා හැරීමට කටයුතු කළ යුතු වේ. | ජල යෝජනා ක්‍රම සඳහා ක්ලෝරීන් යෙදීමට කටයුතු යොදා ඇති අතර ඉදිරියේදී ක්ලෝරිනේටරයක් සපයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| (ආ) ඉඩම් 11 ක්, සුසාන භූමි 12 ක් හා පොදු ඉඩම් 2 ක නීත්‍යානුකූල අයිතිය සනාථ කිරීමට අදාළ ඔප්පු හෝ පැවරුම් නියෝග නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ආයතනවලින් ඉල්ලීම් සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු සිදු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය
---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, කාර්යසාධන ගිවිසුම් ද අත්සන්කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂය සඳහා අදාළ කටයුතු සිදුකරමින් පවතී. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රදේශයේ පිහිටි ඉඩම් 04 ක් අදාළ අනුමැතීන් නොමැතිව, අනු බෙදුම් කර විකිණීමට ඉඩහැර තිබුණි. | නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වේ. | අදාළ බදු මුදල් අයකර ගැනීමට නීති මඟින් කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) අනු බෙදුම්කර විකුණන ඉඩම්වල වටිනාකමේ දල ඇස්තමේන්තුවකින් සියයට 1 ක බදු මුදලක් අයකර තිබුණ ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව විකිණීමෙන් පසු වටිනාකමින් සියයට 1 ක බදු මුදල ගණනය කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයවිය යුතු ඉතිරි මුදල් ගෙවන ලෙස විකුණුම්කරුවන් වෙත ලිඛිතව දන්වා ඇත. |

3.5 වත්කම් කළමනාකරණය

------------------------------

නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් රු.16,861,440 ක් වටිනා යන්ත්‍ර 02 ක් හා වාහන 4 ක් වර්ෂ 5 කට අධික කාලයක සිට නිශ්ක්‍රීයව පැවැතුණි. | භාවිතයට ගතහැකි ආයතනයකට ලබාදීමට කටයුතු කළ යුතු වේ. | මෙම යන්ත්‍රය ජල බවුසරයකට මාරුකර ගැනීමට අමාත්‍යාංශය හා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇතත්, මේ දක්වා කටයුතු ඉටුවී නොමැත. |
| (ආ) | පැරණි පුස්තකාල ගොඩනැගිල්ලක් වසර 10 ක සිට හා ප්‍රජාශාලා ගොඩනැගිල්ලක් වසර 3 ක සිට නිෂ්කාර්යව පැවතුණි. | ගොඩනැගිලි ඵලදායී කාර්යයකට යොදවා ගත යුතු වේ. | අදාළ ගොඩනැගිල්ල සංවර්ධනයකර භාවිතයට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක පැවැති රු.38,149 ක ශේෂයක් 2013 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | ජංගම ගිණුමට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිල ජංගම ගිණුම වෙත මාරු කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2017 හා 2018 වර්ෂවල රු.1,075,637 ක් වැයකර ඉදිකළ කඩකාමර දෙකක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසාදමා තිබුණි. | ඵලදායී කාර්යයකට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපාර කටයුතු සඳහා ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |

**3.6** අවිධිමත් ගනුදෙනු

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභා බලප්‍රදේශයේ පවත්වාගෙන ගොස් තිබූ ගෝඝාතකාගාරයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | නිලධාරීන්ගේ අධීක්ෂණය නිසි ලෙස පවත්වා ගතයුතු අතර, පරිසර බලපත්‍රය ලබා ගත යුතු වේ. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) රු.3,478,136 ක ණයගිම් වටිනාකමක් විධිමත් අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | කපා හැරීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**3.7** හඳුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ අනතුරට පත්වී තිබූ බැකෝ යන්ත්‍රය සම්බන්ධයෙන් මු.රෙ.104 යටතේ කරන ලද පරීක්ෂණයේ වාර්තාව මෙතෙක් ලබාගෙන නොතිබූ අතර, රු.669,648 ක අලාභය අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්තා කඩිනමින් ලබාගෙන අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. | පරීක්ෂණ වාර්තා ප්‍රධාන අමාත්‍යාංශයෙන් මෙතෙක් ලබාදී නොමැත. |

**3.8** **ප්‍රසම්පාදනය**
**-----------------**

**3.8.1** **ප්‍රසම්පාදන සැලැස්ම**
**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් ද, සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර තිබුණ ද ඊට පරිභාහිරව රු.3,278,640 ක භාණ්ඩ මිලදී ගැනීම් සිදුකර තිබුණි. | චක්‍රලේඛ හා මාර්ගෝපදේශ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂය සඳහා සැළස්මක් සකස්කර ඇත. |

3.8.2 **කොන්ත්‍රාත් පරිපාලනය**
**----------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මිල්ලවාන පන්ගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.398,949 ක් ගෙවීම් කර අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරූ මාර්ග කොටසේ දෙපස 1:2:4 (20mm) කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් ඉදිකර තිබූ ආරක්ෂිත කොන්ක්‍රීට් වැටිය (edge curb) පහසුවෙන් කැඩිය හැකි දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා ඉදිකර තිබීමෙන් ආරක්ෂිත කොන්ක්‍රීට් වැටියේ බොහෝ ස්ථාන පුපුරා ඉරිතලාගොස් තිබූ අතර කුට්ටි ගල් නියමිත ප්‍රමිතියට නොතිබුණි. | ප්‍රමිතියට අනුව කටයුතු සිදු නොකිරීම සම්බන්ධව වගකිව යුත්තන් හඳුනා ගත යුතු වේ. | මින් ඉදිරියට එවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආරියගම සමඟි ප්‍රජාමූල සංවිධානය සඳහා නල ළිඳක් ඉදිකිරීම වෙනුවෙන් රු.48,875 ක් වැයකර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ජල භූ විද්‍යා සමීක්ෂණයක් සිදුකර තිබුණ අතර, එකී සමීක්ෂණ වාර්තාව පදනම් කරගෙන මීටර 70 ක් ගැඹුරින් සාමාන්‍ය මිනුම් ක්‍රමය භාවිතයෙන් නල ළිඳක් ඉදිකිරීමට රු.625,048 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවීමෙන් පසුව මණ්ඩලය විසින් නල ළිඳක් ඉදිකර තිබුණි. පසුව ප්‍රමාණවත් ජල ධාරිතාවයක් නොමැති බව තහවුරු කර එම ව්‍යාපෘතිය අසාර්ථක බවට වාර්තාවක් ලබාදී තිබුණි. | නිවැරදි සමීක්ෂණයක් මඟින් ජල මූලාශ්‍ර සොයාගෙන ඉදිකිරීම් කළ යුතු වේ. | ජල සම්පත් මණ්ඩලයෙන් නිවැරදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොමැත. කෙසේ වෙතත්, රජයේ ආයතනයක් වෙත අදාළ මුදල් ගෙවීම් සිදුකර ඇති බැවින් නිශ්ඵල ගෙවීමක් නොවන බව දන්වමි. |